## ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය - 2020

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය.

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍යප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවටසාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය හා වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි.මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනිමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේඅඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වි ඇති බව හා හෙළිදරව් කිරීම් වල ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වර්ෂයේ ක්ෂය වියදම වූ රු.6,305,429 න් රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය වටිනාකම වූ රු. 3,499,323 අඩුකර ශුද්ධ වටිනාකම වූ රු.2,806,105 ක් පමණක් ක්ෂය වියදම් ලෙස දක්වා තිබුණි. | මණ්ඩලය විසින් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මිලදී ගත් ස්ථාවර වත්කම් සඳහා ක්‍රමක්ෂය 2019 වර්ෂයේ සිට සිදුකර ඇති අතර ඉදිරියේ දී ප්‍රමිත අංක 01 හි 48 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වර්ෂයේ ක්ෂය වියදම සහ ක්‍රමක්ෂය වටිනාකම වෙන වෙනම පෙන්වීමට කටයුතු කරමි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වර්ෂයේ ක්ෂය වියදම සහ ක්‍රමක්ෂය වටිනාකම වෙන වෙනම පෙන්වීමට කටයුතු කළ යුතුය . |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 47 ඡේදය ප්‍රකාරව ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදවල වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කරන මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව ගලපා සන්සන්ධනාත්මක අගයන් ප්‍රතිෂ්ඨාපනය කර, එම වැරදි වල ස්වභාවය හා ගලපන ලද ආකාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී රු. 8,053,259 ක මූල්‍ය ප්‍රකාශනවල වැරදි නිවැරදි කිරීම් කර නැවත ප්‍රතිශ්ඨාපනය කර තිබුණද ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | නිවැරදි කිරීම් කර තිබුණද එය ගිණුම්වල හෙළිදරව් කර නොමැති බැවින් ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරමි. | අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 86 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල එක් එක් දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් දළ ධාරණ අගය නිශ්චය කිරීම සඳහා භාවිතා කළ මිනුම්කරණ පදනමහෙළිදරව් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | ප්‍රමිත අංක 7 හි 86 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ සඳහා භාවිතා කර ඇති මිනුම් පදනම් හෙළිදරව් කර නොමැති බැවින් එය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | දේපළ පිරියත හා උපකරණ සඳහා භාවිතා කළ මිනුම්කරණ පදනම හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයෙහි රජයේ ලැබීම් රු. 1,128,707 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී අපහරණය කර තිබුණු රු. 467,066 ක මුදල සහ එයින් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණු රු. 312,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිව ගලපා නොතිබුණි. | ඉදිරි වර්ෂවල ගිණුම් සකස් කිරීමේදී ඒ කෙරෙහි අවධානය යොමු කර අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂවල ගිණුම් සකස් කිරීමේදී අඩුපාඩු නිවැරදිකළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රු. 691,210 ක වසර 08 කට වඩා පැරණි රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන සහ පුද්ගලයන්ගෙන් අයවිය යුතු ණයගැති ශේෂයන් පැවති අතර එම ණයගැති ලේඛනයේ සඳහන් ඇතැම් ණයගැතියන් ව්‍යාජ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | වසර ගණනාවක් පැරණි මෙම ණය ශේෂ පිළිබඳ මු.රෙ. 104 පරීක්ෂණයක් සිදු කිරීමට අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකර ඇත. | පරීක්ෂණයක් සිදුකර සුදුසු පරිදි ක්‍රියා කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 104 | සමාලෝචිත වර්ෂයේදී නාරහේන්පිට ප්‍රධාන කාර්යාලයේ සිදු වූ රු .48,990 ක් වටිනාකමැති ජංගම දුරකථනයක් අස්ථානගත වීම 2012 වර්ෂයේදී නාරහේන්පිට පැළ තවානේ සිදු වූ රු. 77,362 ක මුදල් වංචා සහ 2018 වර්ෂයේ අනුරාධපුර උපුල්දෙණිය ගබඩාවේ සිදු වූ රු.4,094,596 ක වටිනාකමැති සෝයා බෝංචි කිලෝ ග්‍රෑම් 37,323 ක් අස්ථානගත වීම සම්බන්ධ පරීක්ෂණ සිදුකර අලාභයන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ සිදු වූ රු 48,990 . ක් වටිනා ජංගම දුරකථනය සම්බන්ධ මු.රෙ.104 පරීක්ෂණය සිදුකරමින් පවතී. නාරාහේන්පිට පැළ තවානේ සොරකම සම්බන්ධ මූලික විමර්ශනය සිදුකොට අවසන් වූ අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කොට අදාළ වගකිව යුතු නිලධාරිනිය වෙත චෝදනා පත්‍ර යවා ඇත. එයට අදාළ ඉදිරි කටයුතු සිදුකරමි. අනුරාධපුර උපුල්දෙණිය | මුදල් රෙගුලාසි ප්‍රකාරව අප්‍රමාදව පරීක්ෂණ සිදු කර අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගබඩාවේ සෝයා බෝංචි තොගය අස්ථානගත වීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කමිටුවක් පත්කොට ඇත. | |
| (ආ) | අගෝස්තු 2020 28 දිනැති අංක ද 2020/01රන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ.371(2) | කාර්යය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් තුන් දෙනෙකුට ගමන් වියදම්, ප්‍රවාහන වියදම් සහ මිලදී ගැනීම් සඳහා ලබාදුන් රු.118,500 ක් අත්තිකාරම් 04 ක් පියවීම සඳහා දින 42 සිට දින 102 දක්වා කාලයක් ගතකර තිබුණි. | අත්තිකාරම් 4 න් 3 ක් බුත්තල, තණමල්විල ගොවිපලවල කටයුතු වෙනුවෙන් ලබාගත් බැවින් අදාල කාර්ය නිම කිරීමට යම්කිසි කාලයක් ගත වී ඇත. ඉතිරි අත්තිකාරම කොරෝනා වසංගගය නිසා අවශ්‍ය සනීපාරක්ෂක භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් ලබාගත් අතර එවකට වෙළෙඳපොළ තුළ එකී භාණ්ඩවල හිගයක් පැවතීම නිසා මිලදී ගැනීම් ප්‍රමාදය මත පියවීම ප්‍රමාද වී ඇත. | කාර්යය නිම කළ වහාම තත්කාර්ය අතුරු අග්‍රිම පියවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 12,505,208 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 70,409,680ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 57,904,472 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් හා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන රු. 25,534,210 කින් අඩු වීම වෙනත් මෙහෙයුම් ආදායම රු. 55,441,647 කින් අඩුවීම, පොලී ආදායම රු. 2,030,776 කින් අඩුවීම, වෙනත් ආදායම රු. 1,049,828 කින් අඩු වීම, සේවක පාරිශ්‍රමික රු. 3,961,912 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර / අමාත්‍යාංශ ප්‍රදාන, වෙනත් මෙහෙයුම් ආදායම්, පොලී ආදායම් හා වෙනත් ආදායම් පිළිවෙළින් සියයට 34, 86, 12 හා 55 ක් අඩු වී තිබුණි. එසේම සේවක පරිශ්‍රමික වියදම සියයට 19 කින් වැඩි වී තිබුණු අතර සැපයුම් හා අවශ්‍යතා වියදම් හා ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා හා වෙනත් වියදම් පිළිවෙළින් සියයට 59 කින් 69 කින් අඩු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම් අතිරික්ත අනුපාතය සියයට 27.79 කින් අඩුවී ඇති අතර ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙළින් සියයට 0.73 කින් හා සියයට 0.77 කින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 සහ 2018 වර්ෂවලදී 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ දක්වා ඇති අරමුණක් නොවූ වැව්වල පස් ඉවත් කර අධිවේගී මාර්ගවලට විකිණීමේ කටයුතු සිදුකර තිබුණි. පස් ඉවත් කිරීම වෙනුවෙන් රු.3,370,595 ක වියදමක් දරා තිබුණු අතර අධිවේගී මාර්ගවලට පස් විකිණීමෙන් රු. 81,134,631 ක ආදායමක් ලබා තිබුණි. වැව් ව්‍යාපෘති වාර්තාවට අනුව සපයන ලද පස් සඳහා අදාළ ගොවි සංවිධාන වලින් මණ්ඩලයට මුදල් ලබාගෙන එම මුදල් රජයේ ප්‍රතිපාදනද සමග යොදා කුඩා වැව් නිසි ප්‍රමිතියට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපදේශකත්වය යටතේ සංවර්ධනය කළ යුතු බව දක්වා තිබුණත් එසේ නොකර රු. 77,764,036 ක් ස්ථාවර තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි. | ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ පනතේ, මණ්ඩලයේ පොදු අරමුණු 3 II යටතේ සහ එම පනතේ 4 කරුණෙහි සඳහන් මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීම පිණිස (ඒ) වගන්තියේ වගන්තිය ප්‍රකාරව කටයුතු කර ඇත. රාජ්‍ය තන්ත්‍රයේ දේශපාලන ප්‍රතිපත්ති හැලහැප්පීමත් සමග උක්ත ව්‍යාපෘතියේ කටයුතු නතර වුණි. නමුත් එම ව්‍යාපෘතියෙන් උත්පාදනය කළ මෙකී මුදල ඉදිරි සංවර්ධන කටයුතු සඳහා භාවිතා කළ හැකි වන සේ සුරක්ෂිතව ඇත. | මණ්ඩලයේ පනතට අනුව අදාළ මුදල උපයෝජනය කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සෝයා ආශ්‍රිත ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා පසුගිය ආසන්නතම වර්ෂ 03 ක් ඇතුළත රු. මිලියන 2.8 ක් වැය කර තිබුණද මණ්ඩලය විසින් එම නිෂ්පාදනයන් 2020 වර්ෂය තුළ පාරිභෝගිකයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය යටතේ නවෝත්පාදනය කළ නව නිෂ්පාදනය රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවය යටතේ වෙළඳපොලට හඳුන්වාදීම සඳහා කෙටුම්පත් කළ ගිවිසුම් රාජ්‍ය ලේකම්තුමාගේ උපදෙස් මත වාර්තාවක් ලබා ගැනීම සඳහා මූල්‍ය උපදේශකවරයෙක් වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්තාව ලැබීමෙන් පසු ගිවිසුම් ප්‍රකාරව මෙම නවෝත්පාදනය කළ නව නිෂ්පාදන වෙළඳපොලට හඳුන්වාදීමට අපේක්ෂා කෙරේ. | මණ්ඩලය අවසන් නිෂ්පාදනය පාරිභෝගිකයා වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සබලකරණය කරන ලද සහල් ව්‍යාපෘතියට අදාළව කලංකුට්ටිය කර්මාන්ත ශාලාවේ සහල්වලට මිශ්‍ර කිරීමට පවතින WIP විටමින් කිලෝ ග්‍රෑම් 683.15 ක ප්‍රමාණයක් | ලෝක ආහාර සංවිධානයෙන් ලද සබලකරණ සහල්වලින් කොටසක් භාවිතා කළ නොහැකිව කල් ඉකුත්වී තිබූ බව පිළිගනිමි. සියළු අපහරණ කටයුතු සඳහා | පරීක්ෂණයක් සිදුකර සුදුසු පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කල් ඉකුත් වී භාවිතා කළ නොහැකි වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් 2021 පෙබරවාරි 28 දින වන විටත් පරීක්ෂණයක් සිදුකර අපහරණය කිරීම හෝ අවශ්‍ය වෙනත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 මැයි මස අපහරණ කමිටුව රැස්වීමට තීරණය කර ඇත. | |
| (ඇ) | තණමල්විල කෘෂි ගොවිපළේ 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වාම ශුද්ධ අලාභයක් වාර්තා වී ඇති අතර පොදු කාර්යය පිරිවැයෙන් සියයට 60 සිට 90 ට වැඩි ප්‍රතිශතයක් වැටුප් හා වේතන සඳහා දරා ඇති බව නිරීක්ෂණය විය. | තණමල්විල පවතින අක්කර 16 ක ගොවිපලක ආරක්ෂාව, දෛනික පාලන සහ සංවර්ධන යන සම්පූර්ණ කටයුතු වෙනුවෙන් එක් සේවක මහතෙකු යොමු කර ඇත. ඔහුගෙන් ලබාගත් එකී සේවාවන් වෙනුවෙන් වේතන ගෙවීමක් සිදුකර ඇත. පැවති අයහපත් කාලගුණික තත්ත්වය තුළ ඵලදායී ක්‍රියාත්මක කිරීමට අප ආයතනයට මෙන්ම ප්‍රදේශයේ ජීවත් වන කෘෂි ප්‍රජාවට ද නොහැකි වූ බව සැබෑවය. ප්‍රදේශයේ කෘෂි ප්‍රජාවගේ සහභාගීත්වයෙන් කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් 2021 වර්ෂය සඳහා ආරම්භ කිරීමට ප්‍රතිපත්තිමය කටයුතු සිදුකර ඇත. | අලාභ අවම කර ලාභ ලැබිය හැකි පරිදි ගොවිපළ කළමනාකරණය කළ යුතුය. |
| (ඈ) | අක්කර 10 කින් පමණ සමන්විත බුත්තල ගොවිපළේ භූමියෙන් අක්කර 02 ක පමණ ප්‍රමාණයක් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට භාවිතා කළද ඉතිරි භූමි ප්‍රමාණය ඵලදායී ලෙස වගා කටයුතු සඳහාඋපයෝජනය කර නොමැති බව නිරීක්ෂණය විය. | රාජ්‍ය ලේකම්තුමාගේ උපදෙස් පරිදි බුත්තල ගොවිපල බීජ නිෂ්පාදන ගොවිපලක් ලෙස සංවර්ධනය කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරමින් ඇත. | භූමි ප්‍රමාණය ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ඉ) | පාරම්පරික සහල් අලෙවි කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීමට අවධානය යොමු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | පාරම්පරික සහල් අලෙවි කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස්කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල පොම්ප 03 ක්, ප්ලාස්ටික් ජල ටැංකියක් (ලීටර් 2000), වී මෝල් සඳහා භාවිත කරන ලද විදුලි මෝටර් 06 ක්, මඩවීල් 02 ක් හා කොකු නගුල් 01 ක් කර්මාන්තශාලාවේ භාවිතයට නොගෙන පැවතුණි. | අදහස් දක්වා නැත. | අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ එසේ කළ නොහැකි නම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සහල්පිටි නිෂ්පාදනය සඳහා භාවිතා කළ රෝලර් යන්ත්‍ර 01 හා එසවුම් යන්ත්‍ර 02 ක් (ෂිප්ටර්) 2016 පෙබරවාරි 29 දින සිට භාවිතා කර නොමැති අතර වර්ෂ 03 කට අධික කාලයක සිට අභාවිතව පැවතුණි. | අදහස් දක්වා නැත. | අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පර්යේෂණ ඒකකයේ සුවපෝෂ හා මව්පෝෂ නිෂ්පාදන සඳහා භාවිත කළ ස්ටිකර් 14,243 ක්, පෝෂණ මල්ල සඳහා භාවිතා කළ ඇතුළත කවර හා හිස් කවර 26,087 ක් හා සුවපෝෂ ග්‍රෑම් 200 පැකට්වල ඇසුරුම් 14,062 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අභාවිතව පැවතුණි. | අදහස් දක්වා නැත. | අනවශ්‍ය මිලදී ගැනීම් නොකළ යුතුය. මෙම ද්‍රව්‍ය උපයෝජනයට හෝ අපහරණයට පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017, 2018 සහ 2019 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | පාර්ලිමේන්තුවට යැවීමට කටයුතු කරමි. 2018 වාර්ෂික වාර්තාව දෙමළ, ඉංග්‍රීසි භාෂා පරිවර්තනය සඳහා යවා ඇති අතර එය ලද විගස මුද්‍රණය කර යැවීමට කටයුතු කරමි. 2019 වාර්ෂික වාර්තාව සකස් කර නිරීක්ෂණය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යවා ඇති අතර නිරීක්ෂණය ලද වහාම මුද්‍රණය කර පාර්ලිමේන්තුවට යැවීමට කටයුතු කරමි. | නොපමාව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘති 15 ක් සඳහා රු.මිලියන 172 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර ඉන් රු. මිලියන 140 ක් වැයකර නොතිබුණි. එම ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් රු. මිලියන 42 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ ව්‍යාපෘති 08 ක කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. | 2020 පළමු කාර්තුවේ සිට පැවති කොරෝනා වසංගත තත්ත්වය නිසා ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මටඅනුකූලව කාර්යයන් සිදු කළ යුතුය. |
| (ආ) | පාරම්පරික සහල් මිලදී ගැනීමේ ව්‍යාපෘතියේ ගබඩාව අලුත් වැඩියාව සඳහා රු.මිලියන 4,750 ක් වෙන්කර තිබුණ ද එම කාර්ය සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නැත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යයන් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තණමල්විල ගොවිපලේ යල කන්නය සඳහා සෝයා බෝංචි වගා කිරීම සඳහා රු.2012,400 ක ප්‍රතිපාදන වෙන් කර ඉන් සෝයා බෝංචි කිලෝ ග්‍රෑම් 2,240 ක අස්වැන්නක් ලබාගැනීමට අපේක්ෂා කර තිබුණ ද රු.440,000 ක් වැයකර සෝයා බෝංචි කිලෝග්‍රෑම් 562 ක අස්වැන්නක් ලබාගෙන තිබුණි. එය අපේක්ෂා කළ අස්වැන්නෙන් සියයට 25 ක් විය. | අදහස් දක්වා නැත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යයන් සිදු කළ යුතුය. |
| (ඇ) | තණමල්විල ගොවිපලේ වියළි ගොම පොහොර මෙට්‍රික් ටොන් 2,000 ක් සැකසීමට, කාබනික පොහොර සකසන ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට හා අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීමට රු. මිලියන 3,163 ක් වෙන්කර තිබුණ ද ඉන් රු. මිලියන 1,045 ක් වැයකර ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම පමණක් සිදුකර තිබුණි. | අදහස් දක්වා නැත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යයන් සිදු කළ යුතුය. |
| (ඉ) | තණමල්විල ගොවිපලේ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2019 වර්ෂයේදී වියළි ගොම මෙට්‍රික් ටොන් 75 ක් හා 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වියළි ගොම මෙට්‍රික් ටොන් 20 ක් සැකසීමට සැලසුම් කර තිබුණ ද වර්ෂ 02 ම එම නිෂ්පාදනයන් සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නැත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යයන් සිදු කළ යුතුය. |
| (ඊ) | 2020 ක්‍රියාකාරී සැලැස්ම අනුව කිලෝ ග්‍රෑම් 01 ක පාරම්පරික සහල් පැකට් 35,400 ක් සකස් කිරීමට සැලසුම් කර තිබුණු අතර එය 2019 වර්ෂයේ සැලසුම් කළ සහල් පැකට් ප්‍රමාණයට වඩා සියයට 56 ක ප්‍රතිශතයකින් අඩු බව නිරීක්ෂණය විය. එසේම 2020 වර්ෂයේ සැලසුම් කළ ප්‍රමාණයෙන් සියයට 43 ක ප්‍රමාණයක පමණක් සහල් පැකට් සකසා තිබෙන බව ද නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යයන් සිදු කළ යුතුය. |

## 4.3 අයවැය පාලනය

------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | --------------------------------------- | ----------- |
| මණ්ඩලයේ 2020 වර්ෂයේ අයවැයගත ආදායම් හා තත්‍ය ආදායම් පරීක්ෂාවේදී සියයට 2 සිට සියයට 100 දක්වා විචලනයන් පැවති අතර අයවැයගත වියදම් හා තත්‍ය වියදම් පරීක්ෂාවේදී සියයට 26 සිට සියයට 93 දක්වා විචලනයක් පැවතුණි. | 2020 වර්ෂයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අඩුවෙන් ප්‍රතිපාදන ලබාදෙන ලදී. ඒ අනුව ද විචලනයන් සිදු වී ඇත. එමෙන්ම 2020 වසරේ උද්ගත වූ කොරෝනා වසංගතය නිසා කාර්යාලය වසා දැමීමට සිදුවිය. එම හේතුවෙන් ඇතැම් කාර්යයන් සිදු කිරීමට නොහැකි විය. එබැවින් ආදායම්, වියදම්වල අඩුවක් දක්නට ඇත. ඒ අනුව අයවැය ගත ආදායම් හා වියදම්වලට වඩා සත්‍ය ආදායම්, වියදම්වල විචලනයන් සිදු වී ඇත. | අයවැය ලේඛනය පාලනමය කාරණයන් ලෙස යොදා ගත යුතුය. |